**බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ**

**පළමු වාර පරීක්ෂණය - 2014**

**7 ශ්‍රේණිය**

**ගණිතය**

ල. ...............

නම/විභාග අංකය: ........................................................................ කාලය : පැය 02 යි.

## I කොටස

* සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) 10 ත් 20 ත් අතර සියළුම ඉරට්ට සංඛ්‍යා ලියා දක්වන්න.

(02) 65734 , සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය කීයද?

(03) මුල්ම ප්‍රථමක සංඛ්‍යාව කුමක්ද?


(04) 18 හි සියළුම සාධක ලියා දක්වන්න.

(05) රූපයේ දැක්වෙන්නේ කලාප වලට වෙන්කර දැක්වූ සංඛ්‍යාවකි.

| 1 200 302 |
|---|

ඒ අනුව 32075851 යන සංඛ්‍යාව කලාප වලට වෙන්කර දක්වන්න.

(06) මෙම කෝණයේ බාහු නම් කරන්න.




(07) නිමල්කාගේ උස 148 cm කි. මෙය ප්‍රකාශ කළ හැකි වෙනත් ආකාරයක් ලියන්න.

(08) $x = 2$ වන විට $x^3$ හි අගය කීයද?

(09) $3^5$ මෙහි දර්ශකය ...................... වේ. පාදය .................... වේ.

(10) 12, ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.

(11) 3kg 352g x 5 =

(12) පහත සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.
-2 , -3 , 0 , 4 , 1

(13) $3^2 x^2 y$ විහිදුවා ලියන්න.

(14) "මහරගම" යන වචනයේ අකුරුකුලකය ලැයිස්තුගත කර ලියා දක්වන්න.

(15) 2016 අධික අවුරුද්දක් ඊළඟට අධික අවුරුද්දක් වන වර්ෂය කුමක්ද?

(16) (-9) + (+6) = ........ හිස්තැන පුරවන්න.

(17) පරිසරයේ දක්නට ලැබෙන ද්විපාර්ශ්වික සමමිතිය ඇති වස්තු 2 ක් නම් කරන්න.

(18) 252 යන සංඛ්‍යාව 3 න් බෙදේද නොබෙදේද? හේතු දක්වන්න.

(19) -3 > .... (-8 , -2 , -5) හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරා ලියන්න.

(20) කිසියම් සංඛ්‍යා 2 කට පොදුවූ විශාලම සාධකය කුමන නමින් හැඳින්වේද?

To download past papers visit
www.vajirapani.blogspot.com

## II කොටස

* පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
ඒ සඳහා වෙනම කොලයක් භාවිත කරන්න.

(01) සංඛ්‍යා ප්‍රහේලිකා නිර්මාණය පිළිබඳ ඔබලබා ඇති දැනුම උපයෝගි කරගෙන පහත ප්‍රහේලිකාව විසඳන්න. රූප සටහන පිළිතුරු පත්‍රයේ පිටපත් කරගන්න.

(a) හරහට

a) 4 හි ගුණාකාරයකි.

b) $3^4$ හි අගය


c) 6 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවකි.

පහළට

a) $12^2$ හි අගය.

b) 220 ට අඩු විශාලම ඔත්තේ සංඛ්‍යාව.

e) පස්වන වර්ග සංඛ්‍යාව වේ.




(ලකුණු 2 x 6 = 12)

(02) (i) 50148 සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය කීයද? (ලකුණු 01)

(ii) 50148 සංඛ්‍යාව ඉතිරි නැතිව 6 න් බෙදේද? නොබෙදේද? හේතු දක්වන්න. (ලකුණු 03)

(iii) පහත දැක්වෙන සංඛ්‍යා අතරෙන් 4 න් බෙදෙන සංඛ්‍යා තෝරන්න.

69, 2400, 81, 148, 810, 128 (ලකුණු 03)

(iv) 12 = 2 x 2 x 3

18 = 2 x 3 x 3 ඉහත ප්‍රථමක සාධක වල ගුණිත උපකාර කර ගනිමින්

12, 18 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය හා කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(ලකුණු 04)

(v) 1750 g, kg වලින් දක්වන්න. (ලකුණු 01)

(ලකුණු 12)

(03) (i) ක්‍රි. ව. 2028 අධික අවුරුද්දක් වේද? නොවේද? හේතු දක්වන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් වර්ෂ වලින් අධික අවුරුද්දක්වන්නේ කුමන වර්ෂයන්ද? (ලකුණු 03)

2008, 1900, 2012, 2010

(iii) 1998 කී වෙනි ශත වර්ෂයද? (ලකුණු 03)

(iv)

| පැය | මිනිත්තු |
|---|---|
| 18 | 44 |
| +12 | 22 |

| | මාස | දින | පැය |
|---|---|---|---|
| | 04 | 10 | 12 |
| - | 01 | 14 | 20 |

(ලකුණු 03)

To download past papers visit www.vajirapani.blogspot.com

(ලකුණු 12)

(04) (i) 27, 3 හි බලයක් ලෙස ලියන්න. (ලකුණු 03)

(ii) $3^3 x^2 y^2$ විහිදුවා ලියන්න (ලකුණු 03)

(iii) $x = 2$, $y = 3$ වන විට පහත බලවල අගය සොයන්න.

a) $x^3 y$ b) $3x^2 y^3$ (ලකුණු 04)

(iv) 64 බලයක් ලෙස ලිවීමේදී දර්ශකය 6 නම් පාදය කුමක් විය යුතුද? (ලකුණු 02)

(ලකුණු 12)

(05) (i) කෝණ මැනීමට භාවිත කරන උපකරණය කුමක්ද? (ලකුණු 01)

(ii) ගතික කෝණ 2 කට හා ස්ථිතික කෝණ 2 කට උදාහරණ දෙන්න. (ලකුණු 04)

(iii) $65^0$ ක කෝණයක් අඳින්න. (ලකුණු 03)

(iv) සමතල පොළව හා බිත්තිය අතර කෝණය කුමක්ද? (ලකුණු 02)

(v) වේලාව 8.00 සිට 8.20 වන විට මිනිත්තු කටුව කරකැවෙන කෝණය කුමන වර්ගයට අයත් වේද? (ලකුණු 02)


(ලකුණු 12)

(06) (i) පෙරදිග සංගීතයේ ස්වර කුලකය ලැයිස්තුගත කර ලියා දක්වන්න. (ලකුණු 04)

(ii) {දක්ෂ ළමයින්} මෙය කුලකයක්ද? නොවේද? හේතු දක්වන්න. (ලකුණු 04)

(iii) 3, 4, 8 යන ඉලක්කම් තුනම එක් වතාවක් පමණක් යොදාගනිමින් ලිවිය හැකි ඉරට්ට සංඛ්‍යා කුලකය ලියන්න.

(iv)




A කුලකයේ අවයව විස්තර කිරීමක් ලෙස දක්වන්න. (ලකුණු 04)

(ලකුණු 3 x 4 = 12)